# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 42/15 — 1973 ජනවාරි 15 වැනි සඳුද — 1973.01.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ජනා.කා. අංකය : ඩබ්ලිව්. 68 (22)/73.

**මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව (40 වන අධිකාරය වන) මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1973 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ.

**නියෝග**

1. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මෙහි වූ උපලේඛනයෙහි පළමුවන තීරයේ නිශ්චිතව සඳහන් එක් එක් පළාත් පාලන ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, ඒ එක් එක් පළාත් පාලන ආයතනය පිහිටා ඇති පරිපාලන දිසාවෙහි සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත, මෙම නියෝගය බල පවත්නා තාක් හා ඒ තාක් පමණක්, 1971 ජූලි මස 1 වැනි දින සිට පැවරිය යුතුය ; තවද එපරිද්දෙන් ඒ එක් එක් පළාත් පාලන ආයතනයේ කටයුතු පරිපාලනය පැවරී ඇති සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ඉහත කී කාලසීමාව තුළ මෙම උපලේඛනයේ දෙවන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් ආඥාපනත් යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ පළාත් පාලන ආයතනයේ සහ එහි සභාපතිගේ ද බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටුකිරීම කළ යුතුය.

2. 1 වන නියෝගයෙහි " පළාත් පාලන ආයතනය " යන යෙදුමෙන් යම් නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

**උපලේඛනය**

| පළමුවැනි තීරය<br>පළාත් පාලන ආයතනයේ නම | දෙවැනි තීරය |
|---|---|
| ඌරගස්මංහන්දිය ගම් සභාව | (257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනත |
| පිලාන–මැටරඹ ගම් සභාව (ගාල්ල දිස්ත්‍රික්කය) | |
| රම්බොඩගල්ල ගම් සභාව (කුරුණෑගල දිස්ත්‍රික්කය) | |
| කුලියාපිටිය නගර සභාව | (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනත |


ශ්‍රී ලංකාවේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

26/45——ශක් 18867—2,500 (72/12)